ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association

Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

**2026.09.05** **චක්‍රලේඛ අංක : 68/2026**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**සිඟිති බාලදක්ෂ - ලී පදක්කම් පුහුණුව**

**07 වන IV අදියර සිඟිති බාලදක්ෂ උසස් පාඨමාලාව**

**2026 නොවැම්බර් මස 07 සිට 12 දක්වා**

**මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**සිඟිති බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථකව නිම කළ නායක/නායිකාවන් සඳහා IV වන අදියර **සිඟිති බාලදක්ෂ** උසස් පාඨමාලාව **2026 නොවැම්බර් මස 07 වන සෙනසුරාදා සිට 12 වන බ්‍රහස්පතින්දා දක්වා** මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුකිරීමේ නායිකා **ඉනෝකා ජයසේකර මහත්මියගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 සැප්තැම්බර් මස 30 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කරවීමට කටයුතු කරන්න.

පාඨමාලා ගාස්තුව රු. 5,500/- කි.

තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය **2026 ඔක්තෝම්බර් මස 03 වන සෙනසුරාදා දින පෙ.ව 10.00 ට** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත් වේ.

➢ **IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**

i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.

ii. 2026 වසර සඳහා නව අධිකාරී පත්‍රයක් ලබා තිබීම හෝ 2026 වසරට නවීකරණය කර තිබීම.

iii. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

iv. 2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු පාඨමාලාව පටන් ගන්නා දිනට මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)

➢ **සම්මුඛ පරීක්ෂණයට පැමිණිමේදී රැගෙන ආ යුතු දේ :**

1. තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතු ය.
2. දින 06 ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතු ය.


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.

Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

3. **2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)**

4. **වලංගු අධිකාරී පත්‍රයේ පිටපතක්**

5. **බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තා පොත (1-5 පොත) සම්පූර්ණ කර පැමිණීම.**

6. **එදින සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.**

**<u>සැලකිය යුතු කරුණු</u> :**

- ✓ **අධිකාරී පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.**
- ✓ **පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.**

**ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරන ලෙස කාරුණික ව දැනුම් දෙමු.**

**ස්තුතියි.**

**මෙයට,**
**බාලදක්ෂ සේවයේ නියුතු,**

| | |
|---|---|
| **කර්නල් පද්මලාල් පෙරේරා** | **නීතිඥ මනෝජ් නානායක්කාර** |
| **ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්** | **ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්** |

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

<u>පිටපත -</u> 1. **ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්**
2. **සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**